#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2381/23 – 2024 අප්‍රේල් මස 22 වැනි සඳුදා – 2024.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 13/2017

**(81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනත**

(81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 6 සහ 10 වන වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2024 අප්‍රේල් මස 18 දින,
කොළඹ දී ය.

**නියෝග**

2019 ජනවාරි මස 03 වන දින අංක 2104/31 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධිත, 1942 ජූලි මස 31 වන දින අංක 8979 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1942 ණය සහනදායක නියෝගවල 3 වන නියෝගයේ (2) වන අනු නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් ඒ නියෝගය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(2) මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක රැස්වීමකට පැමිණෙන මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක සභාපතිවරයාට එක් එක් රැස්වීම් වාරය සම්බන්ධයෙන් රුපියල් පන්දහසක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය."

1A – G 41790 – 05 (2024/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*